21

කාර්යක්ෂම ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස ව්‍යාපෘති ක්‍රමය

ආර්.ඒ. පාරමී ලක්ෂිකා

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

සාරසංක්ෂේපය

වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ව්‍යාපෘති පාදක ඉගෙනුම් ක්‍රමවේදය ඉතා වැදගත් මෙවලමක් ලෙස හඳුනාගත හැකි ය. මෙමගින් ව්‍යාපෘති ක්‍රමයේ ස්වභාවය, එහි ප්‍රධාන ලක්ෂණ, මූලික කාර්යයන්, වැදගත්කම සහ පවතින අභියෝග පිළිබඳ ව පුළුල් විශ්ලේෂණයක් සිදු කරයි. ජෝන් ඩුවි, විලියම් හර්ඩ් කිල්පැට්රික් සහ එලා ෆ්ලැග් යන්ග් වැනි ප්‍රමුඛ අධ්‍යාපනඥයින්ගේ දර්ශනයන් මත පදනම් වූ මෙම ක්‍රමය සැබෑ ලෝකයේ ගැටලු විසඳීම අරමුණු කරගත් සිසුන්ගේ මානසික හා කායික ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කරන ප්‍රායෝගික ක්‍රියාවලියකි. ව්‍යාපෘතියක් සාර්ථක කර ගැනීම සඳහා සැලසුම් කිරීම, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම යන මූලික කාර්යයන් හතර මනා ලෙස කළමනාකරණය කළ යුතු අතර එහි දී SMART අරමුණු, පිරිවැය, නිශ්චිත කාල රාමුව සහ ගුණාත්මකභාවය කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කෙරේ. මෙම ක්‍රමවේදය ඇසුරෙන් විද්‍යාව, ගණිතය, කලා, කෘෂිකර්මය සහ තොරතුරු තාක්ෂණය වැනි විවිධ විෂයයන් ප්‍රායෝගික ව ඒකාබද්ධ කිරීමට අවස්ථාව ලැබෙන අතර එමඟින් සිසුන්ගේ විවේචනාත්මක චින්තනය, ගැටලු විසඳීමේ කුසලතා, සහයෝගිතාව, සන්නිවේදනය සහ 21 වැනි සියවසට අවශ්‍ය මෘදු කුසලතා වර්ධනය වේ. විෂය නිර්දේශ ආවරණය කිරීමට ඇති කාලීන අපහසුතා, ප්‍රමාණවත් නොවන භෞතික හා මූල්‍ය සම්පත් මෙන් ම සාම්ප්‍රදායික විභාග රටාව තුළ පවතින විධිමත් පරීක්ෂණ ක්‍රමවේදයන්ගේ හිඟකම මෙහි ඇති ප්‍රධාන අභියෝග වුව ද කටපාඩම් කිරීමේ සාම්ප්‍රදායික රටාවෙන් බැහැර ව අනාගත සමාජයට අවශ්‍ය සක්‍රීය, නිර්මාණශීලී සහ ස්වාධීන පුද්ගලයන් බිහි කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රමය පාසල් පද්ධතිය තුළ සාර්ථක ව යොදාගත හැකි ආකාරය මෙම ලිපිය මගින් අවධාරණය කෙරේ.

මුඛ්‍ය පද - ව්‍යාපෘති ක්‍රමය, ව්‍යාපෘති පාදක ඉගෙනුම, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය, විෂයයන් ඒකාබද්ධ කිරීම, 21 වැනි සියවසේ කුසලතා

හැඳින්වීම

ජීවිතය පුරා මතකයෙන් ඈත් නොවන අද්දැකීමක් බවට පත්වන්නේ කැමැත්තෙන් හා ක්‍රියාශීලි ලෙස යම් කාර්යයක් සාර්ථක ව නිම කළ විට දී ය. එය තෘප්තියක් ගෙන දෙන අද්දැකීමක් වන අතර එකතු කර ගත් අද්දැකීම වඩා ඵලදායි හා අර්ථවත් බවින් පිරිපුන් ඉගෙනුමක් ද වේ. මෙවැනි අද්දැකීම් ප්‍රායෝගික ලෙස සිසුන්ට අත්පත් කර ගත හැකි වන සාර්ථක ක්‍රමවේදයක් වශයෙන් ව්‍යාපෘති පාදක ඉගෙනුම හඳුනා ගත හැකි වේ. මේ අනුව වර්තමාන ලෝකයේ ආයතනික මෙන් ම ආයතනික නොවන බොහෝ ක්‍රියාකාරකම් තුළ අපේක්ෂිත නවමු

අරමුණු සාර්ථක ලෙස ඉටු කර ගැනීම සඳහා ව්‍යාපෘති නම් වූ යාන්ත්‍රණය උපයෝගී කර ගැනීම නව ප්‍රවණතාව වී ඇත.

ව්‍යාපෘතියක් යනු ප්‍රායෝගික ක්‍රියාකාරකම් රාශියකින් සමන්විත වූ ක්‍රියාවලියක් වශයෙන් සරල ව හඳුනා ගත හැකි ය. මෙය තවදුරටත් විමසා බැලීමේ දී අවබෝධ වන්නේ කිසියම් අපේක්ෂිත අරමුණක් (නිපැයුමක් හෝ සේවාවක්) ඉටු කර ගැනීම සඳහා සැලසුම් කළ සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝගි කර ගන්නා නිශ්චිත කාලයක් තුළ ක්‍රියාවට නංවනු ලබන ක්‍රියාවලියක් වශයෙනි. මෙම ක්‍රමය තුළ සිසුහු තම කාර්යය තීරණය කරන අතර ඒ සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා තමන් ම සොයා ගනී. ගුරුවරයා මෙහි දී ක්‍රියා කරන්නේ මඟ පෙන්වන්නෙකු ලෙස පමණි. ප්‍රමුඛ අධ්‍යාපනඥයින් වන ජෝන් ඩුවී (John Dewey), විලියම් හර්ඩ් කිල්පැට්රික් (William Head Kilpatrick), සහ එලා ෆ්ලැග් යන්ග් (Ella Flagg Young) යනාදීන්ගේ දර්ශනයන් මත පදනම් වූ මෙම ව්‍යාපෘති ක්‍රමය සිසුන් කණ්ඩායමක් වශයෙන් හෝ ස්වාධීන ව හෝ නිරත වන යම් කිසි ගැටලුවක් පදනම් කරගත් සැබෑ ලෝකයේ ක්‍රියාවලියකි.

ව්‍යාපෘතියකට දීර්ඝ නිර්වචනයක් මෙලෙස ලබා දිය හැකි ය. මානසික ක්‍රියාකාරිත්වයෙන් හා කායික ක්‍රියාකාරිත්වයකින් යුක්ත වූ සියුම් ලෙස ඇලුම් කරන යමක් හා බැඳීමක් ඇතිවන අයුරින් පන්ති කාමරයේ දී ලබා ගන්නා දැනුමට අමතර ප්‍රතිලාභයක් ලබා ගැනීමට හැකිවන ලෙස උගත් දේ සැබෑ ලෝකයේ භාවිතයට ගැනීමට අවස්ථා සලසමින් සිසුන් කණ්ඩායමක් වශයෙන් හෝ ස්වාධීන ව හෝ නිරත වන යම් කිසි ගැටලුවක් පදනම් කර ගත් ක්‍රියාවලියකි.

ව්‍යාපෘති ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

ව්‍යාපෘති ක්‍රමයක් යනු හුදෙක් කාර්යයක් කිරීමක් නොව එහි යථාර්ථවාදී සහ ක්‍රියාකාරී ස්වභාවය හේතුවෙන් එය සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රමවලින් වෙනස් වන්නකි. එහි ප්‍රධාන ලක්ෂණ කිහිපයකි.

- ඕනෑම ව්‍යාපෘතියක් අරමුණු සහගත වේ. එකී අරමුණු සුවිශේෂී ඒවා විය යුතු අතර SMART විය යුතු ය.
- ව්‍යාපෘතියකට පිරිවැයක් ඇත. ව්‍යාපෘතියක් සඳහා මානව හො භෞතික සම්පත් (Men, Material, Money, Machine) මිනිසුන්, ද්‍රව්‍ය, යන්ත්‍ර හෝ මුදල් යෙදවිය යුතු ය. ඒ සඳහා යන වියදම අයවැය ලේඛනයකින් දැක්විය යුතු ය.
- ව්‍යාපෘතියකට නිශ්චිත වූ කාල රාමුවක් තිබේ. ඒ ඒ කාලසීමාවට අදාළ ක්‍රියාකාරකම් පැහැදිලි ව දැක්විය යුතු ය.
- ව්‍යාපෘතියකට ගුණයක් තිබේ. එහි දී ගුණාත්මකබව, බාහිර පෙනුම, අභ්‍යන්තර තත්ත්වය, කල්පැවැත්ම, අරපිරිමැස්ම පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
- ව්‍යාපෘතියක් යනු සිසුන්ගේ ජීවිතයට සම්බන්ධ සැබෑ ලෝකයේ ගැටලුවක් හෝ අභියෝගයකි. උදාහරණයක් ලෙස පාසල් වත්තේ එළවළු වගාවක් නිර්මාණය කිරීම, පාරිසරික ගැටලුවකට විසඳුමක් සෙවීම හෝ වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වැනි දේ පෙන්වා දිය හැකි ය.

- එක් ව්‍යාපෘතියක් තුළ විවිධ විෂයයන් ඒකාබද්ධ වේ. උදාහරණයක් ලෙස සූර්ය පැනල ආකෘතියක් සෑදීමේ දී විද්‍යාව (විදුලිය), ගණිතය (ගණනය කිරීම්) සහ කලා (නිර්මාණය) වැනි විෂයයන්හි දැනුම භාවිතා කළ හැකි ය.
- සිසුන් තමන් විසින් ම සැලසුම්, පර්යේෂණ සහ ඇගයීම් සිදු කරයි. ඔවුන් දැනුම ලබා ගන්නේ කියවීමෙන් හෝ සවන් දීමෙන් පමණක් නොව එය ප්‍රායෝගිකව යෙදවීමෙනි.
- සිසුන් බොහෝ විට කණ්ඩායම් වශයෙන් වැඩ කරන නිසා ඔවුන්ට එකිනෙකා සමඟ අදහස් හුවමාරු කර ගැනීමට ගැටලු විසඳීමට සහ එකිනෙකාට උදව් කිරීමට අවස්ථාව ලැබේ.

ව්‍යාපෘති ක්‍රියාවලියෙහි මූලික කාර්යයන්

ව්‍යාපෘති ක්‍රියාවලියෙහි මූලික කාර්යයන් සතරකි. සැලසුම් කිරීම, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම යන මෙම මූලික කාර්යයන් සතර අනුපිළිවෙළකට හෝ වෙන් වෙන් ව ක්‍රියාත්මක වීම අවශ්‍යයෙන් ම සිදු විය යුත්තේ නො වේ.

1. සැලසුම් කිරීම

සැලසුම යනු ව්‍යාපෘති කාර්යය තුළ භෞතික, මානව හා මූල්‍ය සම්පත් කාලයට අනුරූප ව හසුරුවා ගැනීමේ ක්‍රියාපටිපාටිය පෙළ ගැස්වීමකි. මෙහි දී ගැටලුවට අදාළ අරමුණු නිශ්චය කිරීමෙන් අනතුරු ව උචිත නිර්ණායක යටතේ විකල්ප විසඳුම් හා වඩාත් උචිත විසඳුම තෝරා ගැනීම, කාල රාමුව සැකසීම, පිරිවිතර හා සැලසුම් ලේඛන සැකසීම, සම්පත් තෝරා ගැනීම හා තක්සේරු කිරීම, කාර්යය සංවිධානය ගොඩ නැගීම, ආකෘති තැනීම හා නිමැවුම ක්‍රියානුරූපී තත්ත්වයට පත් කිරීම, ප්‍රගති සමාලෝචනය ආදි සියලු කාර්යයන් ද ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ දී අවධානයට ලක් විය යුතු වේ. තව ද භෞතික, මානව හා මූල්‍ය සම්පත් කාලයට අනුරූප ව හසුරුවා ගැනීමේ දි මතුවිය හැකි අභියෝග හා ඒවාට පිළියම් නිගමනය කිරීම සැලසුමෙහි පූර්ව කාර්යයක් ලෙස සිදු විය යුත්තක් බව සැලකීම වැදගත් වේ.

2. තීරණ ගැනීම

ව්‍යාපෘතියක් තුළ ගනු ලබන තීරණ සාර්ථක නිමැවුමක් එළි දැක්වීමට හේතු පාදක වේ. ගනු ලබන තීරණ මත පිහිටා සැලසුම් සකස් කිරීම සිදු විය යුතු ය. ව්‍යාපෘතියක් තුළ ගනු ලබන තීරණ ව්‍යාපෘතියේ ඇතුළත් ක්‍රියාකාරකම්වලට පමණක් සීමා නොවේ. ව්‍යාපෘතිය තුළ මතුවන අවධානම, ආරක්ෂාව හා පාරිසරික බලපෑම් කළමනාකරණය, නිමැවුමේ ගුණාත්මක බව, ආකර්ෂණීය බව, ඵලදායීතාව, උපයෝගීතාව හා සම්බන්ධ තීරණ ද ඇතුළත් විය යුතු වේ.

3. ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතියක් තුළ ගෙන ඇති තීරණ හා සැලසුම අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සාර්ථක ව්‍යාපෘතියක ලක්ෂණයකි. ආචාර ධර්මවලට පටහැනි නොවන අයුරින් සම්පත් ඵලදායී ව හා පරිසර හිතකාමී ලෙස යොදවා

ගැනීම කළමනාකරණය කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී රැස් කර ගන්නා තොරතුරු, ලබා ගන්නා අද්දැකීම්, නිරීක්ෂණ හා නිගමන ලේඛන ගත කළ යුතු වන අතර ව්‍යාපෘතිය නිමවන තෙක් යාවත්කාලීන ව පවත්වා ගත යුතු වේ.

4. **පසු විපරම**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සැලසුමට හා කාල රාමුවට අනුකූල නො වන ලෙස ක්‍රියාත්මක වීම මතු වූ අනපේක්ෂිත ගැටලු තත්ත්ව හා අභියෝග, ඒවා විසඳා ගැනීමේ දී යොදා ගත් උපාය මාර්ග හා යොදා ගැනීමට තිබූ උපායමාර්ග හා පිළියම් සාකච්ඡා වීම වැදගත් වේ. එසේ ම ව්‍යාපෘති ක්‍රියාවලිය තුළ රැස් කරගත් නව දැනුම, ව්‍යාපෘතිය හා සම්බන්ධ වූ පුද්ගලයන්ගේ ප්‍රතිජනනාත්මක විවේචන තුළ සංවර්ධනය කර ගත යුතු විවිධ පැතිකඩ මෙන් ම ශක්තීන් සාකච්ඡාවට බඳුන් විය යුතු වේ. ඒ ඇසුරෙන් ඉදිරි ව්‍යාපෘති කාර්යයන් සඳහා ශක්තිමත් පදනමක් ගොඩ නැගේ.

ව්‍යාපෘති ක්‍රමයේ වැදගත්කම

ව්‍යාපෘති ක්‍රමය සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා කාර්යක්ෂම වන්නේ එය සිසුන්ගේ බහුවිධ කුසලතා සහ හැකියාවන් ද එකවර සංවර්ධනය කරන බැවිනි. යමක් ප්‍රායෝගික ව කිරීමෙන් ලැබෙන අද්දැකීම, මතක තබා ගැනීම පහසු කරයි. සිසුන් තමන් විසින් ම තොරතුරු සොයාගෙන එය යෙදවීම නිසා ඔවුන්ට විෂය කරුණ පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ලැබෙන අතර එය මතකයෙන් පහව යන්නේ නැත. ව්‍යාපෘති ක්‍රමය තුළ සිසුන්ට අනපේක්ෂිත ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. මේවාට විසඳුම් සෙවීමේ දී ඔවුන්ගේ විවේචනාත්මක චින්තන හැකියාවන් සහ ගැටලු විසඳීමේ කුසලතා දියුණු වේ. ගුරුවරයාගේ නිරන්තර මඟ පෙන්වීමකින් තොරව තමන්ගේ කාර්යය කළමනාකරණය කිරීමට සිසුන් හුරු වේ. එවිට ඔවුන් තම ඉගෙනුම් ක්‍රියාවලියේ වගකීම භාර ගනී. එමෙන්ම කණ්ඩායම් වශයෙන් වැඩ කිරීමේ දී සිසුන්ට අදහස් හුවමාරු කර ගැනීමට සාකච්ඡා කිරීමට සහ එකඟතාවලට පැමිණීමට සිදු වේ. මෙය ඔවුන්ගේ සන්නිවේදන සහ සහයෝගිතා කුසලතා ඉහළ නංවයි. ව්‍යාපෘති අවසන් වන විට සිසුන් තුළ ආත්ම විශ්වාසය සහ සාර්ථකත්වයක් පිළිබඳ හැඟීමක් ඇති වේ. මෙය ඔවුන්ගේ අනාගතය සඳහා ඉතා වැදගත් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ව්‍යාපෘති යොදා ගැනීමේ අවශ්‍යතාව

ව්‍යාපෘති මත පදනම් වූ අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම වඩාත් ප්‍රබල කරවීම සඳහා වාතාවරණය සකස් කර දෙන්නක් බව සනාථ වී ඇත. මේ හැර පාසල් විෂයන් ඉගෙනීමේ දී තාක්ෂණික කුසලතා සංවර්ධනය කර ගැනීමට අයත් බහුවිධ කුසලතා මෙන් මෘදු කුසලතා ඇතුළු යහපත් වැඩ පුරුදු හා ආකල්ප සිසුන්ට අත්පත් කර ගැනීමේ ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර දීම ගුරු කාර්යයේ වැදගත් අංගයක් වේ. එමඟින්,

- නව්‍ය නිමැවුම් බිහි කිරීම සඳහා අවශ්‍ය වන ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීමේ මං සැලසීම.
- කණ්ඩායම් කාර්යයක් ලෙස අරමුණු ළඟා කර ගැනීම සඳහා සංවිධානාත්මක ව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වීම.

- අවිධිමත් ව්‍යූහයන් තුළ ස්ව දැනුම ගොඩනගා ගැනීමට අවශ්‍ය මාර්ගයක් වීම.
- පර්යේෂණාත්මක ව නව දැනුම, හැකියා හා ආකල්ප සංවර්ධනය කර ගැනීමට ඉවහල් වීම.
- සැබෑ ලෝකයේ ගැටලුවලට සාර්ථක ලෙස මුහුණ දීමට අවශ්‍ය වන පෞරුෂය සංවර්ධනය වීම ආදිය සිදු වේ.

ව්‍යාපෘති පාදක කර ගත් ඉගෙනුම් ක්‍රමවේදය විවිධ තාක්ෂණික ක්ෂේත්‍ර විෂයානුබද්ධ ව අධ්‍යයනයේ යෙදීම ඉඩ සැලසීමට අමතර ව ඉහත සඳහන් කළ පුළුල් චර්යා ධර්මවල සංවර්ධනයක් ඇති කිරීම සිදු කරයි.

ව්‍යාපෘති ක්‍රමය පාසල් පද්ධතිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි ද?

සැබෑ ලෙස ම එය වර්තමාන පාසල් පද්ධතිය තුළ ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි ය. පාසල් අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීය (Student-Centered) එකක් බවට පත් කිරීමට ඇති ප්‍රබල ම මෙවලම ව්‍යාපෘති ක්‍රමයයි. මෙහි දී ගුරුවරයා දේශකයකු නොව සිසුන්ට මඟ පෙන්වන පහසුකම් සපයන්නෙකු (Facilitator) ලෙස පමණක් ක්‍රියා කරයි. ව්‍යාපෘති ක්‍රමයේ ඇති සුවිශේෂී ම වාසියක් වන්නේ එක ම ව්‍යාපෘතියක් තුළ විවිධ විෂයයන් ඒකාබද්ධ (Integration of Subjects) කිරීමට ඇති හැකියාවයි.

ක්‍රියාත්මක කළ හැකි විෂයයන් සහ ප්‍රායෝගික උදාහරණ පිළිබඳ ව සැලකීමේ දී විද්‍යාව (Science) විෂය තුළ සූර්ය පැනල ආකෘතියක් නිර්මාණය කිරීම, ජල පිරිපහදු පද්ධති හෝ පාසල් කාලගුණ මධ්‍යස්ථානයක් සැකසීම වැනි දෑ මඟින් විදුලිය හෝ පරිසර විද්‍යාව වැනි විෂය කරුණු ප්‍රායෝගික ව උගනියි. ගණිතය (Mathematics) විෂය තුළ ව්‍යාපෘතියකට අදාළ මිනුම් ලබා ගැනීම, පිරිවැය ඇස්තමේන්තු කිරීම, අයවැය ලේඛන සැකසීම සහ දත්ත ගණනය කිරීම් සඳහා ගණිතමය සංකල්ප යොදා ගැනීම සිදු කළ හැකි ය. කලා සහ සෞන්දර්ය විෂයයන් (Arts and Aesthetic) විෂයන් තුළ නිමැවුම්වල බාහිර පෙනුම ආකර්ෂණීය ලෙස සැලසුම් කිරීම, ආකෘති නිර්මාණය (Design) සහ ප්‍රදර්ශන අංග සකස් කිරීම ද සිදු කළ හැකි ය. කෘෂිකර්මාන්තය සහ භූගෝල විද්‍යාව (Agriculture and Geography) තුළ දී පාසල් වත්තේ කාබනික එළවළු වගාවක් ඇති කිරීම, පාංශු ඛාදනය වැළැක්වීමේ ව්‍යාපෘති හෝ ප්‍රාදේශීය පාරිසරික ගැටලුවලට විසඳුම් සෙවීම ආදිය ද තොරතුරු තාක්ෂණ විෂයේ දී (ICT) ව්‍යාපෘතියේ දත්ත විශ්ලේෂණය, වාර්තා සකස් කිරීම හෝ පාසල වෙනුවෙන් නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම යනාදිය සිදු කළ හැකි ය.

ව්‍යාපෘති ක්‍රමයට ඇති අභියෝග

ව්‍යාපෘති ක්‍රමයේ ඇති වාසි රැසක් තිබුණ ද එය ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් අභියෝග තිබිය හැකි ය. පවතින විෂය නිර්දේශ නියමිත කාලය තුළ ආවරණය කිරීමට සිදුවීම නිසා ව්‍යාපෘති සඳහා කාලය වෙන් කිරීම අපහසු වීම ප්‍රධාන අවාසියක් ලෙස දැක්විය හැකි ය. භෞතික, තාක්ෂණික සහ මූල්‍ය සම්පත් පාසල් තුළ ප්‍රමාණවත් ව නො තිබීම හා සිසුන්ගේ ප්‍රායෝගික දක්ෂතා නිවැරදි ව ඇගයීමට ලක් කරන විධිමත් පරීක්ෂණ ක්‍රමවේද සාම්ප්‍රදායික විභාග රටාව තුළ හිඟ වීම එවැනි අභියෝග වන නමුත් නවීන අධ්‍යාපනය තුළ ව්‍යාපෘති

පාදක ඉගෙනුම (Project Based Learning) ඉතා වැදගත් ස්ථානයක් ගෙන ඇති අතර එය 21 වැනි සියවසට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමට හොඳම ක්‍රමවේදයක් ලෙස සැලකේ.

අවසාන වශයෙන් තෝරා ගත් අරමුණු ඉටුකර ගැනීම සඳහා පිරිවැය, කාලය හා ගුණය පිළිබඳ ව සලකා බලමින් ක්‍රියාත්මක වන ආරම්භයක් හා අවසානයක් සහිත කාර්යයක් ලෙස ව්‍යාපෘති ක්‍රමය හඳුන්වා දිය හැකි ය. එලෙස ව්‍යාපෘති ක්‍රමයක පවතින ලක්ෂණත් ව්‍යාපෘති ක්‍රමයෙහි මූලික කාර්යයන් පිළිබඳවත් ව්‍යාපෘති ක්‍රමයක පවතින වැදගත්කම සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ව්‍යාපෘති ක්‍රමය යොදා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳවත් අවසාන වශයෙන් ව්‍යාපෘතිය ක්‍රමය තුළ පවතින අභියෝග පිළිබඳවත් ඉහතින් කරුණු ගොනුකර ඇත.

සමස්තයක් ලෙස ගත් කළ ඒ අනුව ව්‍යාපෘති ක්‍රමය යනු හුදෙක් විෂය කරුණු කටපාඩම් කරන ක්‍රමයක් නොව සිසුන්ට සැබෑ ලෝකයේ අද්දැකීම් ලබා දෙමින් ඔවුන්ගේ විවිධ කුසලතා හා පෞරුෂය වර්ධනය කරන ප්‍රායෝගික සහ කාර්යක්ෂම ඉගෙනුම් ක්‍රමවේදයකි. මෙය අනාගත සමාජයට අවශ්‍ය සක්‍රීය නිර්මාණශීලී සහ ස්වාධීන පුද්ගලයන් බිහි කිරීමට මහෝපකාරී වේ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Goyal, A. (2025, January 22). *Project Method of Teaching: Advantages, Steps and Examples*. Extramarks Blogs: Weaving Stories for Schools, Students, and Parents; Extramarks. https://www.extramarks.com/blogs/teachers/project-method-of-teaching/

ගුරු දිවිය සංවර්ධනයට මාර්ගගත අත්වැලක්. (n.d.). Retrieved November 25, 2025, from https://moe.gov.lk/wp-content/uploads/2025/06/learning-and-teaching-methodology-1.pdf

Project-based Education: Finding Solutions to Student Problems in Completing Projects | Social Publishers Foundation. (2021, July 31). *Social Publishers Foundation*. https://www.socialpublishersfoundation.org/knowledge_base/project-based-education-finding-solutions-to-student-problems-in-completing-projects/

Ministry of Education, Sri Lanka. (2025). *Learning and Teaching Methodology Guideline*. https://moe.gov.lk/wp-content/uploads/2025/11/EnglishTransforming-General-Education-06-Oct-2025-1-Copy.pdf

Kokotsaki, D., Menzies, V., & Wiggins, A. (2016). Project-based learning a review of the literature. *Improving Schools*, 19, 267–277. https://www.scirp.org/reference/referencespapers?referenceid=3772454 (Accessed: 06 June 2026).

Kilpatrick, W. H. (1918). The Project Method. *Teachers College Record the Voice of Scholarship in Education*, 19, 319–335. https://www.scirp.org/reference/referencespapers?referenceid=3837370 (Accessed: 06 June 2026).

Bender, W. N. (1970). *Project-Based Learning : Differentiating Instruction for the 21st century*. Internet Archive. https://archive.org/details/projectbasedlear0000bend (Accessed: 06 June 2026).

Dewey, J. (1938). *Experience and Education*. https://talkcurriculum.wordpress.com/wp-content/uploads/2014/09/dewey-j-1938-experience-and-education-pp-17-31-new-york-ny-touchstone.pdf (Accessed: 06 June 2026).

Thomas, J. W. (n.d.). *A review of research on Project-Based learning*. https://tecfa.unige.ch/proj/eteachnet/Thomas_researchreview_PBL.pdf (Accessed: 06 June 2026).